## 1 හැඳින්වීම

### 1.1 ආයතනයේ පසුබිම

**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනය** වර්ෂ 2000 ජූනි මස 3 දින ආරම්භ කරන ලද්දේ කැනඩා කළමනාකරණ ගණකාධිකාරී සංගමය, ඇමරිකා එක්සත් ජනපද කළමනාකරණ ගණකාධිකාරී ආයතනය, ලෝක ගණකාධිකාරී ආයතනය වන ගණකාධිකාරීන්ගේ ජාත්‍යන්තර එක්සත් ආයතන සමූහය (IFAC) සහ කලාපීය කළමනාකරණ ගණකාධිකාරී ආයතන යන ජාත්‍යන්තර ගණකාධිකාරී ආයතන වල මාර්ගෝපදේශ පදනම් කරගෙනය.

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකරණ ගණකාධිකාරී වෘත්තීයේ ප්‍රධාන වැඩ කොටසක් ඉටුකරන ඉන්දියාව, පාකිස්ථානය සහ බංගලාදේශය යන දකුණු ආසියානු රටවල් වල ඔවුන්ගේම ජාතික කළමනාකරණ ගණකාධිකාරී ආයතන පවතී. ඉන්දියාව, බංග්ලාදේශය, පකිස්ථානය, ශ්‍රී ලංකාව හා නේපාලය යන රටවලින් සමන්විත දකුණු ආසියනු ගණකාධිකාරී ආයතන සමූහයේ (SAFA) ශ්‍රී ලංකාව ආරම්භක සාමාජිකයකු වූවද එහි අපේම ජාතික කළමනාකරණ ගණකාධිකාරී ආයතනයක් නොතිබුනි.

**සංස්ථාගතකිරීම**

මේ හේතුව මත 2009 මාර්තු 18 වන දින වෙළද, වාණිජ,පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන ගරු ඇමති තුමා විසින් පාර්ලිමේන්තුව වෙත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන පනත ඉදිරිපත් කරණලදි.මෙම පනත 2009 අංක 23 දරණ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතන පනත ලෙස සම්මතවූ අතර ගරු කතානායක විසින් 2009 අප්‍රේල් මස 20 වන දින සහතික කරණලදි.වරලත් ගණකාධිකාරී ආයතනය පිහිටුවා වසර 50 ක් ගෙවී ගිය පසු මෙම කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පිහිටුවීම ඉතිහාසයේ සන්දිස්ථානයක් සනිටුහන් කරයි.

පුද්ගලික අංශයේ ප්‍රධාන කාර්යයක් වන ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රධාන වශයෙන් කර්මාන්ත, වාණිජ, මූල්‍ය, අධ්‍යාපන හා සේවා අංශ සඳහා කළමනාකරණ ගණකාධිකාරී වරුන්ගේ අවශ්‍යතාවය වර්ධනය වී ඇත. කළමනාකරණ ගණකාධිකාරීන්ගේ අවශ්‍යතාවය අගනගරය වන කොළඹට පමණක් නොව කර්මාන්ත හා වෙළඳාම පිට පලාත් තුළට ගෙනයාමේ රාජ්‍ය අවශ්‍යතාවය හේතුවෙන් පලාත්වලටද ඔවුන් අවශ්‍යව ඇත. එසේම ශ්‍රී ලාංකික කළමනාකරණ ගණකාධිකාරී ආයතනයක් මගින් උසස්පෙළ සුදුසුකම් ලැබූ බොහෝ ශිෂ්‍යයන් සහ විශ්ව විද්‍යාල උපාධිධාරීන්ට තමන්ගේ වෘත්තීය මාර්ගෝපදේශනය වශයෙන් පිලිගත් කළමනාකරණ ගණකාධිකාරී පාඨමාලාවක් හදරා වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් විශේෂයෙන් පුද්ගලික අංශයේ රැකියා ලබාගැනීමට හේතුවනු ඇත.

ශ්‍රී ලාංකික ආයතනයක් වශයෙන් සංගමය කළමනාකරණ ගණකාධිකාරී වෘත්තීය පාඨමාලාවක් දැරිය හැකි ගාස්තුවකට හැදැරීම සඳහා අවස්ථාව ලබාදී ඇත.

**පාලක සභාව**

පාලක සභාව සාමාජිකයින් 8 දෙනකුගෙන් සමන්විතය.
පාලක සභාව විසින් එහි විවිධ කටයුතු කරගෙන යාම සදහා කමිටු පත්කර ඇත.

**මෙම කමිටු වන්නේ**

අධ්‍යාපන හා පුහුණු කමිටුව
විභාග කමිටුව
සඟරා සහ ප්‍රකාශණ කමිටුව
බදු හා නීති කමිටුව
චර්යාධර්ම හා විනය කමිටුව
සම්මේලන හා ජාතික සම්මේලන කමිටුව
මුදල් හා පරිපාලන කමිටුව

ආයතනය පිලිගත් ප්‍රවීන පුද්ගලයන් කිහිප දෙනෙකු අනුසාශක සභාව ලෙස නම්කර ඇත.

ආයතනයට උපදෙස්දීම සදහා විශ්වවිද්‍යාල ආචාර්යවරු, පරිචයේ නියැලුනවුන්,කළමනාකරණ උපදේශකවරු,කර්මාන්ත,වාණිජ හා රාජ්‍ය ප්‍රවීන වෘත්තිකයින්ගෙන් සමන්විත උපදේශක සභාවකින්ද සමන්විතය.

## 1.2 ආයතනයේ පරමාර්ථ

**ආයතනයේ ප්‍රධාන පරමාර්ථ නම්**

1. කළමනාකරණ ගණකාධිකාරි වෘත්තියේ යෙදන ගණකාධිකාරින්ට සාමාජිකත්වය ලබාදීම.

2. කළමනාකරණ ගණකාධිකාරි වෘත්තිය සහ ඊට අදල කරුණු සම්බන්ධ න්‍යායන් සහ පරිචය වැඩිදියුණු කිරීම.

3. සංගමයේ සාමාජිකත්වය ලබාගැනීමට උනන්දුවන පුද්ගලයින් ලියාපදිංචිකිරීම, අධ්‍යාපනය ලබාදීම සහ පුහුණුකිරීම.

4. විභාග පැවැත්වීම හා සංගමයේ විභාග සමත් වී අදල ප්‍රායෝගික පුහුණු අවශ්‍යතාවන් සම්පූර්ණ කරන අයට සාමාජිකත්වය ලබාදීම.

5. කුමන සේවාවක නිරතවී සිටියත් සාමාජිකත්වයේ වෘත්තීය නිදහස ආරක්‍ෂා කිරීම.

6. සාමාජිකයින් තුල උසස් තත්වයේ වෘත්තීය පැවැත්මක් පවත්වාගෙනයාම

7. කළමනාකරණ ගණකාධිකරණ වෘත්තීය කර්මාන්ත, වානිජ්‍යය, අධ්‍යාපනය, මූල්‍ය, රාජ්‍යසේවය සහ තොරතුරු තාක්ෂණය යන කෙෂ්ත්‍ර කරා පුලුල්කිරීම

8. සාමාජිකයින් හා ශිෂ්‍යයින් සඳහා පුස්තකාලයක් හෝ පුස්තකාල පවත්වාගෙන යාම.

9. සාමාජිකයන් හා අනෙකුත් අය හෝ පොදුවේ ගණකාධිකරණ වෘත්තීයේ කාර්යක්‍ෂමභාවයට හා ප්‍රයෝජනයට වැඩ දයක බව වර්ධනය කිරීම සඳහා ආයතනයේ කටයුතු වලට අදල පොත්පත් සඟරා හා නිබන්ධන මුද්‍රණය කර බෙදහැරීම.

10. සාමාජිකයින්ගේ උනන්දුව ඇතිකිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදීම. හා ත්‍යාග ප්‍රදනය

11. සාමාජිකයින්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා පශ්චාත් කලමනාකරණ සුදුසුකම් වන ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි ලබාදීමට කටයුතුකිරීම.

## 1.3. ජාත්‍යන්තර ගණකාධිකාරී ආයතනවල සාමාජිකත්වය

ආයතනය දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ සාමාජිකයකු වන අතර මෙහි අනිකුත් සාමාජිකයින් වන්නේ ඉන්දියාව,පකිස්ථානය,බංගලාදේශය,ශ්‍රී ලංකාව සහ නේපාලය යන රටවල වරලත් සහ කලමනාකරණ ගණකාධිකාරි ආයතනයන්ය.

මීට අමතරව ජාත්‍යන්තර ගණකාධිකාරිවරුන්ගේ සම්මේල (IFAC) ආශ්‍රිත සාමාජිකත්වය උසුලයි.
IFAC යනු ගණකාධිකාරිවරුන්ගේ ගෝලීය සංවිධානය වන අතර රටවල් 125 ක ගණකාධිකාරි ආයතන 164 ක් නියෝජනය කරණ මෙහි පොදු පරිචයේ, අධ්‍යාපනයේ,රාජ්‍ය අංශයේ හා කර්මාන්ත අංශයේ නියැලි මුලු සාමාජිකත්වය මිලියන 2.5 කි.

### 1.4. විවිධ ආයතන හා විශ්ව විද්‍යාල සමග අවබෝධතා ගිවිසුම්

ආයතනය පහත සදහන් විශ්ව විද්‍යාල හා ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
විවෘත විශ්ව විද්‍යලය
ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය(SLIATE)
ශ්‍රී ලංකා තරුණ ව්‍යවසායකයින්(YESL)
පාකිස්ථාන් පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරි ආයතනය (ICMAP)
බංගලාදේශ පිරිවැය හා කළමනාකරණ ගණකාධිකාරි ආයතනය (ICMAB)
කැනඩා කළමනාකරණ ගණකාධිකාරි සංගමය (CMA - Canada)
ඉන්දීය පිරිවැය හා වැඩ ගණකාධිකාරි ආයතනය (ICWAI)
සහතිකලත් වෘත්තිය ගණකාධිකාරීන් ඔස්ට්‍රේලියාව (CPA - Australia)
වරලත් සහතිකලත් ගණකාධිකාරි සංගමය බ්‍රිතාන්‍යය (CIMA - UK)

### 1.5. වර්තමාන සාමාජිකත්වය

ආයතනය 2000 කට වැඩි සාමාජික හා අධි සාමාජික පිරිසකගෙන් සමන්විතවන අතර එමගින් වෘත්තීය කළමනාකරණ ගණකාධිකාරි ආයතනයක අවශ්‍යතාවය පැහැදිලිවන අතර වෘත්තීය ගණකාධිකාරීන් ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාශය මනාව පැහැදිලි වෙයි.

සාමාජිකයින් වර්ග දෙකකට අයතවන අතර ඔවුනට පහත පරිදි පදවිනාම භාවිතාකල හැකිය.

සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරි අධි සාමාජිකයින් (FCMA)
සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරි අශ්‍රිත සාමාජිකයින් (ACMA)
සාමාජිකත්වය අපේක්ෂාකරණ අය ලේකම් කාර්යාලය විමසන්න.

## 2. **CMA** වෘත්තීය සුදුසුකම

CMA වෘත්තීය සුදුසුකම වෘත්තීය සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන් බිහිකිරීම සඳහාවූ උපායමාර්ග කළමනාකරණ ගණකාධිකරණය විශේෂිතවූ පාඨමාලාවකි. සාමාන්‍යයෙන් CMA යොමුකර ඇත්තේ ව්‍යාපාරයන්හි අනාගතය පිළිබඳව වන අතර අතීතය ගැන නොවේ. ඔව්හු මූල්‍ය, කළමනාකරණ හා අනෙකුත් තොරතුරු ආයතනයේ ඉදිරියට යාමට හා බලාපොරොත්තු සඵල කර ගැනීමට හේතුවන උපාය මාර්ග හා මෙහෙයුම් තීරණ ගැනීමට පාවිච්චි කරති.

CMA ඔවුන්ගේ පදවිනාමය තුලින් උසස් ලෙස විශේෂ පිළිගැනීමකට ලක්වී ඇත. මෙයට අදියර හතරක විභාග,විෂයානුබදධ සිද්ධි අධ්‍යයනයක් හා අවුරුදු 3 ක ප්‍රායෝගික පුහුණු අවශ්‍යතාවයද ඇතුලත්ය.

පහත සඳහන් අය සඳහා මෙම සුදුසුකම නිර්දේශ කෙරේ.

1. උසස් පෙල විභාගයෙන් පසු පූර්ණ කාල හෝ අර්ධ කාල සිසුන්.
2. විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්.
3. විශව විද්‍යාලවලට ඇතුලුවීමට බලාසිටින සිසුන්.
4. තම රැකියාව පුද්ගලික හෝ රාජ්‍ය අංශයේ යෙදවීමට කැමති උපාධිධාරීන් හා අනෙකුත් වෘත්තීකයින්.
5. රැකියාවල නියුතු අයට අඛණඩ වෘත්තීය සංවර්ධනය හා රැකියා වර්ධන වැඩසටහනක් ලෙස.

සුදුසුකමෙහි එක් විශේෂ ලක්ෂණයක් වන්නේ නම්‍යශීලිභාවය වන අතර ඔවුනට මුලින් විභාග සමත් වී දෙවනුව ප්‍රායෝගික පුහුණුව ලබාගත හැකිය. නැතහොත් දෙකම තමාට පහසු ලෙස එකවර කළ හැකිය.

### 2.1 විභාග විෂය නිර්දේශය

මුල්ම විෂය නිර්දේශ ව්‍යුහය කැනඩා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශිල්පීය සහයෝගය මත සංවර්ධනය කර ඇති අතර මෙවර එය සංවර්ධනය කරණ ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ මහාචාර්ය මංගල පොන්සේකා මහතා ප්‍රමුඛ උපදේශක මන්ඩලයක් විසිනි. සංගමයේ සාමාජිකයින් තමන් විසින්ම කළමනාකරණ ගණකාධිකාරීවරුන් ලෙස වෘත්තීයේ යෙදීම සඳහා සුදුසු විය යුතු අතර එය ජ්‍යෙෂඨ කළමනාකරණ සමූහයක සාමාජිකයකු වීමටද ඉවහල් වේ.

### 2.2 විෂය නිර්දේශ ව්‍යුහය හා උපදෙස් මාධ්‍යය

ආයතනයේ විෂය නිර්දේශය අදියර 5 කින් සමන්විතය.1 පදනම් අදියර, 2 මෙහෙයුම් අදියර,3 කලමනාකරණ අදියර,4 උපායමාර්ගික අදියර හා 5 විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය වේ.

කලමනාකරණ හා උපායමාර්ගික අදියරයන් හා සිද්ධි අධ්‍යයනය සඳහා විභාග පවත්වනුයේ ඉංග්‍රිසි මාධ්‍යයෙන් පමණි. CMA ශ්‍රී ලංකා වෘත්තීය සුදුසුකම මත රැකියා සැපයෙනුයේ ශ්‍රී ලංකාවේ පමණක් නොව විදේශ රැකියාවන් සඳහාද අවස්ථාව පවතී. දේශණ හා විභාග පැවැත්වෙන්නේ ඉංග්‍රීසියෙන් වන අතර එය දේශීයව හා ගෝලීයව ව්‍යාපාර අංශයේ භාවිතාවන භාෂාවයි.

මේ සඳහා නිපුනතා පාඨමාලා 3 ක් ශිෂ්‍යයන්ගේ ඉංග්‍රිසි දැනුම වර්ධනය සඳහා යොදාගැනෙන අතර එක් නිපුනතා පාඨමාලාවක් පරිගණක භාවිතය සඳහා යොදාගැනේ.

පදනම් හා මෙහෙයුම් අදියරයන් සඳහා ඉංග්‍රිසි, සිංහල හා දෙමල මාධ්‍යවලින් විභාග පැවැත්වේ.

## 3. විභාග ව්‍යූහය

විභාග ව්‍යූහය - සිංහල මාධ්‍යය

| පාඨමාලා නම / විෂය නම | විෂය සංකේතය | විභාග පැය |
|---|---|---|
| 1 පදනම් අදියර | | |
| කළමනාකරණ ගිණුම්කරණ මූලධර්ම MAF<br>මූල්‍ය ගිණුම්කරණ මූලධර්ම FAF<br>ව්‍යාපාර ගණිතය හා සංඛ්‍යානය BMS<br>කලමනාකරණය,සාංගමික පාලනය සහ චර්යාධර්ම MGE<br>ව්‍යාපාර ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර මූල්‍ය මූලධර්ම BEF<br>*නිපුනතා පාඨමාලා*<br>Business English 1, BE 1 | FL 1<br>FL2<br>FL 3<br>FL 4<br>FL 5<br><br>SK I | 3<br>3<br>3<br>3<br>3<br><br>3 |
| 2 මෙහෙයුම් අදියර | | |
| මෙහෙයුම් කලමනාකරණ ගිණුම්කරණය OMA<br>මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය FAR<br>මෙහෙයුම් හා තොරතුරු පද්ධති කළමනාකරණය OIM<br>ව්‍යාපාර නීතිය හා බදුකරණය BLT<br>*නිපුනතා පාඨමාලා*<br>*තොරතුරු තාක්ෂණ භාවිතය* ITA<br>Business English 11, BE 11 | ML 1<br>ML 2<br>ML 3<br>ML 4<br><br>SK 2<br>BE II | 3<br>3<br>3<br>4<br><br>3<br>3 |
| **3 Managerial Level - English Medium** | | |
| Integrative Management Accounting (IMA)<br>Corporate Reporting & Analysis (CRA)<br>Marketing & People Management (MPM)<br>Corporate Law & Advance Taxation (CLT)<br>***Skill Course Unit***<br>Professioal Communication (PC) | ML 1<br>ML 2<br>ML 3<br>ML 4<br><br>PC | 3<br>3<br>3<br>4<br><br>3 |
| **4 Strategic Level 1- English Medium** | | |
| Strategic Management Accounting (SMA)<br>Bñiness Strategy & Policy (BSP)<br>Financial Strategy & Policy (FSP)<br>Risk & Control Strategy & Policy (RSP)<br>Integrative Case Study (ICS) | SL 1<br>SL 2<br>SL 3<br>SL 4 | 3<br>3<br>3<br>3 |

## 4. පුස්තකාල පහසුකම්

සාමාජිකයින් හා ශිෂ්‍යයන් සදහා පොත්පත් පරිශීලනය පිණිස පුස්ථකාල පහසුකම් කොළඹ 5 මැක්ලියඩ් පාරේ අංක 22 දරණ ස්ථානයේ පිහිටි සහතිකලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සපයා ඇත.

## 5. ශිෂ්‍ය ලියාපදිංචිය

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශිෂ්‍ය භාවය ලැබීමේ පලමු පියවර ලියාපදිංචියයි. ආයතනයේ විභාග සඳහා පෙනී සිටිය හැක්කේ ලියාපදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවනට පමණකි. ලියාපදිංචිය අවුරුද්ද මුලුල්ලේම විවෘතයි. කෙසේ වෙතත් මැයි මස විභාගය කිරීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙරද නොවැම්බර් මස විභාගය කිරීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් ජූලි 31 දිනට පෙරද ලියාපදිංචි විය යුතුය.

### 5.1 ඇතුළුවීමේ සුදුසුකම්.

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ඇති අයකුට ශිෂ්‍යයෙක් /ශිෂ්‍යාවක් වශයෙන් ලියාපදිංචි විය හැකිය.

1. **(a)** <u>ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රවේශය</u>

   ඉංග්‍රීසි මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට කැමති සිසුන් සඳහා අ.පො.ස (උ.පෙළ) විෂයයන් දෙකකින් සාමාර්ථය සමග අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක්ද ගණිතය විෂය සඳහා සාමාර්ථයක්ද තිබීම අවශ්‍යය.

   **(b)** <u>සිංහල / දෙමළ මාධ්‍යය ප්‍රවේශය</u>

   සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට කැමති සිසුන් සඳහා අ.පො.ස (උ.පෙළ) විෂයයන් දෙකකින් සාමාර්ථය සමග අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සමත්ව තිබීම අවශ්‍යය.

2. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයකින් ලබාගත් අදාල උපාධියක් හෝ සංගමයේ පාලක මණ්ඩලය අනුමත වෙනත් උපාධියක්.

3. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරී සේවයේ සාමාජිකත්වය.

4. එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන් හා පරිපාලකයන්ගේ ආයතනයේ අවසාන විභාගය

5. එක්සත් රාජධානියේ මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ අවසාන විභාගය.

6. එක්සත් රජාධානියේ ජාත්‍යන්තර ගණකාධිකාරී සංගමයේ අවසාන විභාගය.

7. එක්සත් රජාධානියේ හෝ ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ අවසාන විභාගය.

8. වරලත් අලෙවිකරණ ආයතනයේ අවසාන විභාගය.

9. වරලත් ගණකාධිකාරී ආයතනයේ පදනම් /ශි.ව්‍යා.ස 1 විභාගය.

10. වෘත්තීය, විශ්ව විද්‍යාල සහ අනෙකුත් සුදුසුකම් වල කොටසක් සමත්වීම වෙන වෙනම සලකා බැලේ.

11. ගණකාධිකරණ ශිල්පීය ආයතණයේ (AAT) දෙවන අදියර.

12. ජාත්‍යන්තර පොත් තබන්නන්ගේ සංගමයේ (IAB) අවසාන විභාගය.

13. “නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය” යටතේ දක්වා ඇති සුදුසුකම් වලින් එකක් සපුරා ඇති අයට ශිෂ්‍යයන් වශයෙන් ලියාපදිංචි විය හැකිය.

14. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් දෙකකින් සාමාර්ථය ඇතත් අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය සඳහා සාමාර්ථයක් නැති අපේක්ෂකයින් වෘත්තීය ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක ව්‍යාපාර සංනිවේදනය හා ව්‍යාපාර ගණිතය සමත්වී අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් ලියාපදිංචි විය හැකිය.

15. <u>පරිනත ඇතුල්වීම</u>.

ගිණුම් හෝ ව්‍යාපාර කටයුතුවලට අදල රැකියාවක නියුතු අවුරුදු 18 ට වැඩි වසර 2 ක අවම පළපුරුද්දක් ඇති අපේක්ෂකයිනට තම රැකියා ආයතනයේ නිර්දේශය මත "පරිනත ඇතුල්වීම" යටතේ ලියාපදිංචි වියහැකිය.

### 5.2 ලියාපදිංචි කිරීමේ පරිපාටිය.

ශිෂ්‍ය අත්පොත සහ ලියාපදිංචි ඉල්ලුම්පත යම් අපේක්ෂකයෙකුට CMA ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

මෙම ලේඛණ තැපැලෙන් ලබාගැනීමට කැමති අයෙකුට රු. 40 ක මුද්දර ගැසූ තම ලිපිනය ලියූ කවරයක් (12" x 10") එවීමෙන් ලබාගත හැක.

### 5.3 ශිෂ්‍ය ලියාපදිංචි අයදූම්පතට ඇමිණිය යුතු ලියවිලි.

1. අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් වල සහතික කල ජායා පිටපත්.

2. උප්පැන්න සහතිකයේ සහතික කල ජායා පිටපතක්

3. මුද්දර ප්‍රමාණයේ (3.0cm x 2.5cm) වර්ණ ජායාරූප දෙකක්. එක ජායාරූපයක් අයදූම්පතේ අලවන්න. අනෙක් ජායාරූපය ඒ සදහා බලයලත් අයකු සහතික කල යුතුය. එහි ඔබේ නම සහ අත්සන ජායාරූපයේ පිටපැත්තේ තැබිය යුතුය. ජායාරූපයේ ප්‍රමාණය වෙනස් වූවහොත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. සහතිකවල පිටපත් හා ඉල්ලූම්පතට නොඅලවන ලද ජායාරූපය ඉල්ලූම්පත සහතික කරණූ ලබන අය විසින්ම සහතික කල යුතුය. එසේම ඔහුගේ / ඇයගේ නම හා තනතුර ආදිය ඇතුලත් මුද්‍රාව තැබිය යුතුය. ඉල්ලූම්පතේ පාවිච්චි කරනු ලබන නම උප්පැන්න සහතිකයේ දැක්වෙන නම විය යුතුය. ඉල්ලූම්පතේ දැක්වෙත නම උප්පැන්න සහතිකයේ දැක්වෙන නම හා වෙනස් වන්නේ නම් සාමදාන විනිශ්චය කරුවකු විසින් අත්සන් කරන ලද දිව්රුම් පෙත්සමක් ඉදිරිපත් කල යුතුය.

   සහතිකවල පිටපත් හා ඉල්ලූම්පතට නොඅලවන ලද ජායාරූපය නියමිත පරිදි සහතික කර නොමැත්තේ නම් බාරගනු නොලැබේ.

   ලියාපදිංචිය සඳහා වන ඉල්ලූම්පතේ ජායාපිටපත් ලියාපදිංචිය සඳහා යොදා නොගත යුතුය. ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා අයදූම්පත් පැක්ස් මගින් හෝ විද්‍යුත් මාධ්‍ය (ඊ මේල්) මගින් බාරගනු නොලැබේ.

5. ලියාපදිංචි ගාස්තුව හා වාර්ෂික අලූත්කිරීමේ ගාස්තුව ගෙවූ <u>ගෙවීම් වවුචරයේ</u> පිටපත සමග මුදල් ගෙවූ බවට මහජන බැංකු ශාඛාව මගින් ශිෂ්‍යයාට දෙනු ලබන <u>විශේෂ ගෙවීම් වවුචරය</u>. මෙම ගෙවීම් කල හැකි බැංකු ශාඛා ලැයිස්තුවක් විශේෂ ගෙවීම් වවුචරයේ ශිෂ්‍යයාගේ පිටපතේ පසුපිට සඳහන්ය. (විශේෂ ගෙවීම් වවුචරයේ බැංකු මුද්‍රාව සහ බලයලත් නිලධාරියකුගේ අත්සන තිබිය යුතුය) මෙම විශේෂ ගෙවීම් වවුචරය ලියාපදිංචි ගාස්තු ගෙවීම සඳහා පමණක් යොදගත යුතුය.

ශිෂ්‍ය ලියාපදිංචි ඉල්ලුම්පත සමග විභාග ගාස්තු හෝ නිදහස්කිරීමේ ගාස්තු නොගෙවිය යුතුය.

ශිෂ්‍ය ලියාපදිංචි ඉල්ලුම්පත හා අදාල ලියවිලි ලියාපදිංචි තැපෑලෙන් ලේකම් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.එම කවරයේ ඉහල වම් කෙලවරේ **ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා අයදුම්පත** යන්න සඳහන් වියයුතුය.

## 5.4 ලියාපදිංචි ගාස්තු සහ වාර්ෂික දායක ගාස්තු /වෙනස්වීමට ඉඩ ඇත/

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු | රු. 1100.00 |
| වාර්ෂික දායක ගාස්තු | රු. 1000.00 |
| ලියාපදිංචිය සඳහා මුළු ගාස්තුව | රු. 2100.00 |

වසර දෙකක දායක ගාස්තු එකවර ගෙවන්නේ නම් පහත පරිදි 10% ක වට්ටමක් දෙනු ලැබේ.

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු | රු. 1100.00 |
| වසර දෙකක දායක ගාස්තු 10% වට්ටම් අඩුකර | රු. 1800.00 |
| එකතුව | රු. 2900.00 |

වාර්ෂික දායක ගාස්තුව සෑම වර්ෂයකම ජනවාරි 1 දින ගෙවිය යුතුය. ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

සියලුම ලියාපදිංචි ශිෂ්‍යයනට ලියාපදිංචි අංකය යටතේ ශිෂ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරණු ලැබේ.

## 6. අධ්‍යයන ආකාරය

### 6.1 විද්යුත් අධ්‍යයනය

ආයතනයේ විද්යුත් අධ්‍යයනය ඉතා ජනප්‍රිය වෙමින් පවතිනුයේ එය ශිෂ්‍යයන්ට ඉතා පහසු බැවිනි. තමන්ට පහසු වෙලාවක යොමුවිය හැකිය.

කලින්ට වඩා සංවර්ධනය කල හා ජනප්‍රිය වෙමින් පවතින විද්යුත් අධ්‍යයනය අධ්‍යයන පාඨමාලාවේ අඩංගු කරුණු පහසුවෙන් අවබෝධකර ගැනීමට හැකිවීමද වීඩියෝ පාඩම් අඩංගුවීමද විශේෂත්වයකි.

**විද්යුත් අධ්‍යයනය ඇයි**

පූර්ණ කාල හා අර්ධ කාල සේවාවන්හි නිරතවූවන්ට උපාධිධාරීන්ට හා උපාධි අපේක්ෂකයිනට පූර්ණ හෝ අර්ධ වෘත්තිකයින්ට උසස්පෙල සමතුන්ට විශේෂ අවස්ථාවකි.

**විද්යුත් අධ්‍යයන පාඨමාලා තුල අඩංගු මොනවාද**

ප්‍රකෘතිමත්කල පාඨමාලා කියවන්නන්ගේ පහසුව පිණිස ප්‍රවීනයන් විසින් විග්‍රහකරමින් උසස් තත්වයක පවතී.

**විද්යුත් අධ්‍යයන ලබාගතහැකි මධ්‍යස්ථාන තිබේද**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ,නෝඩ්ස්, ආයතනයේ පිවිසුම් මධ්‍යස්ථාන මගින් ඉන්ටනෙට් පහසුකම් ඇති ඕනැම පරිඝණකයක් මගින්

**විෂයට අදාල සැකයක් නිරාකරණය කරගන්නේ කෙසේද**

එක් එක් විෂයට අදාල පරීක්ෂකවරුන් ඇමතිය හැකිය.ශිෂ්‍යයන්ට එක් එක් අවස්ථාවන්හි විෂය සම්බන්ධ ප්‍රශ්න හා උත්තර ඒ සම්බන්ධ ප්‍රවීනයන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබාදී ඇත.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දිවයින පුරා ඇති නෝඩ්ස් මධ්‍යස්ථාන මගින් ලබාදෙන ජාල පහසුකම් විද්යුත් අධ්‍යයනය සඳහා පහසුකම් ලබාදී ඇත.

විද්යුත් අධ්‍යයනය මගින් අධ්‍යාපනය හදාරණ සිසුන්ට ලංකාවේ හෝ ඩුබායි මධ්‍යස්ථානවල සිට විභාගවලට පෙනීසිටිය හැක.

අපේ වෙබ් අඩවියට පිවිස වැඩි විස්තර ලබාගන්න.

### 6.2 දේශන හා ස්ව අධ්‍යයනය

ශිෂ්‍යයනට විභාග සඳහා පෙනී සිටීම පිණිස ආයතනය විසින් හා පිලිගත් අධ්‍යාපන ආයතනවල දේශන සඳහා සහභාගි විය හැකිය. එසේම ස්වඅධ්‍යයනයද කල හැකිය.

### 6.3 අධ්‍යයන පාඨමාලා

එක් එක් විෂය සඳහා CMA විසින් අධ්‍යයන පාඨමාලා සකස් කර ඇති අතර ඒවා ලේකම් කාර්යාලයේ විකිණීම සඳහා ඇත.මුල් අදියර 2 සඳහා අධ්‍යයන පාඨමාලා ඉංග්‍රිසි, සිංහල හා දෙමල භාෂා වලින් ලබාගතහැකි අතර අනෙක් අදියරයන් සඳහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ලබාගත හැකිය. අධ්‍යයන පාඨමාලා මිලදීගැනීම සඳහා ශිෂ්‍යයන් උනන්දු කෙරේ.

## 7. විභාග

1. CMA විභාග සංවිධානය සකස්කර ඇත්තේ පියවරෙන් පියවරටය. එක් එක් අදියර විභාග නිර්මාණය වන්නේ එක් එක් විෂයට අදල ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ දැනුම අවබෝධය, භාවිතය, විග්‍රහය, සංකලනය හා ඇගයීම පිලිබඳ මට්ටම පරීක්ෂාකිරීම සඳහාය. එක් එක් විෂය/ ප්‍රශ්නපත්‍රය සඳහා විභාග පැය ගණන විභාග ව්‍යුහය යටතේ පිටු 8 හි දක්වා ඇත. ඔබට දැකිය හැකි පරිදි ප්‍රධාන අධ්‍යයන ඒකක 17 ක්, නිපුනතා අධ්‍යයන ඒකක 4 ක් හා විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනයක් පැය 68 කදී පරීක්ෂා කෙරේ.

2. ප්‍රධාන අධ්‍යයන ඒකක හා නිපුනතා ඒකක ඇගයීම

ප්‍රධාන අධ්‍යයන ඒකකයක් සමත්වීම සඳහා ලකුණු 50 ක් අවම වශයෙන් ලබා ගතයුතු අතර ඒ සඳහා පහත සඳහන් ශ්‍රේණි ලබාදෙනු ඇත.නිපුනතා අධ්‍යයන ඒකක සඳහාසමත් හෝ අසමත් ලෙස සලකනු ලබන අතර ශිෂ්‍යයන් එය සමත්විය යුතුය.

A - විශිෂ්ඨ සාමාර්ථ, B - හොඳ සාමාර්ථ, C - සාමාර්ථ, D - අසමර්ථ හා E - නරක අසමර්ථ

3. එක් අදියරකින් අනෙක් අදියරට යාම

ප්‍රධාන අධ්‍යයන ඒකක 17 ක්, නිපුනතා අධ්‍යයන ඒකක 4 ක් හා විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනයක් සම්පූර්ණ කලයුතුය.

අ. ශිෂ්‍යයන් පලමු අදියරේ ප්‍රධාන අධ්‍යයන ඒකකයන් ඊලඟ අදියරට යාමට පෙර සම්පූර්ණකර /සමත්වී හෝ නිදහස්වී / තිබිය යුතුය.ශිෂ්‍යයන්ට පලමු අදියරේ සියලුම විෂයයන්ට හෝ කොටසකට පෙනීසිටිය හැක.

ආ. ශිෂ්‍යයන් උපායමාර්ගික අදියරට යාමට පෙර අධ්‍යයන ඒකක 2 හා 3 හි ප්‍රධාන අධ්‍යයන ඒකක හා නිපුනතා ඒකක 4 සමත්වී තිබිය යුතුය.ඔවුනට පහත 1,2,හා 3 නිර්නායකයන් සම්පූර්ණ කර ඇත්නම් අදියර 2 ක විෂයයන් 6 ක උපරිමයකට යටත්ව පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

1. කළමනාකරණ ගිණුම්කරණ අංශයේ (FL1, OL1, ML1, SL1) හා මූල්‍ය ගිණුම්කරණ අංශයේ (FL2, OL2, ML2, SL2) අධ්‍යයන ඒකක අතර තාර්කික සම්බන්ධයක් ඇත.ඒ නිසා ඉහල අධ්‍යයන ඒකකයකට යාමට පෙර පහල අධ්‍යයන ඒකක සමත්වී සිටිය යුතුය.
2. ශිෂ්‍යයන් නිපුනතා ඒකක 2 ට පෙර නිපුනතා ඒකක 1 සමත්විය යුතුය.කෙසේවෙතත් නිපුනතා ඒකක 4ටපෙනීසිටිය හැක්කේ 1 හ 2 සමත් වීමෙන් පසුවය.
3. අදියර 4 හි සියලුම විෂයයන්ට මුල් වතාවේ පෙනී සිටිය යුතුය.විෂය සාමාර්ථයන් ලබාදෙනු ඇත.පලමු වතාවේ වාඩිවීමෙන් පසු අසමත්වූ අධ්‍යයන ඒකක එකවර හෝ වෙනවෙනම ඉල්ලුම් කලහැක.උපායමාර්ග අදියරේ එක් විෂයකට ඌණ සාමාර්ථ ලබාදෙනු ලැබේ.

ශිෂ්‍යයන්ට අදියරක සියලූම විෂයයන්ට හෝ විෂයයන් කිහිපයකට පෙනී සිටිය හැක.

ඇ. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනයට පෙනීසිටිය හැක්කේ අනෙකුත් සියලුම අදියරයන් සම්පූර්ණ කිරීමෙන් පසුවය.

ඈ. එක් එක් අදියර සමත්වීමෙන් පසු ඊට පෙර අදියරයන් සමත්වී ඇත්නම් ශිෂ්‍යයනට ඒ සඳහා සහතිකයක් පිරිනමනු ලැබේ.

4. විෂය නිර්දේශ සංවිධානය

ඒ ඒ විෂය සඳහා ප්‍රධාන මාතෘකා සහ ඒ සඳහා අදාල බර ප්‍රමානය සඳහන් කර ඇත. ඉන් පසු එම මාතෘකා විස්තර කරනු ලැබේ. එහිදී ශිෂ්‍යයා විසින් හැදෑරිය යුතු කරුණු විස්තර කරයි. එය ශිෂ්‍යයන්ට මෙන්ම ගුරුවරුනටද වැදගත්වේ.

ප්‍රධාන මාතෘකා යටතේ උප මාතෘකා මගින් අදාල කරුණු විස්තර කරයි.

පාලක සභාව සිංහල හා දෙමල මාධ්‍ය සිසුන් සේම පලමු වතාවට ලියාපදිංචිවූ සිසුන්ද ව්‍යාපාර ඉංග්‍රිසි 1 පාඨමාලාව මිලදී ගැනීම අනිවාර්ය බව සඳහන් කරයි. එසේ හෙයින් ලියාපදිංචි අවස්ථාවේ එය මිලදී ලන්නා ලෙස ශිෂ්‍යයන්ට අවවාද කරනු ලැබේ. එසේ මිලදී නොගත් අයගේ විභාග ඉල්ලුම්පත් සලකාබලනු නොලැබේ.

## 8 විභාග දිනයන්

විභාග වසරකට දෙවරක් මැයි හා නොවැම්බර් මාස වල පවත්වනු ලැබේ. විභාගය අවසන් වී සති 7 ත් 8 ත් අතර කාලයක් තුල ප්‍රතිපල නිකුත් කරණු ලැබේ.විස්තරාත්මක ප්‍රතිපල සියලුම අපේක්ෂකයිනට තැපැලෙන් දන්වනු ලැබේ.

විභාග ඉල්ලුම් පත් සඳහා අවසන් දිනය
මැයි විභාගය - මාර්තු 1
නොවැම්බර් විභාගය - සැප්තැම්බර් 1

## 8.1. විභාග ගාස්තු /වෙනස්වීමට ඉඩ ඇත/

| **අදියර** | **විෂයක් සඳහා** |
|---|---|
| පදනම් අදියර | රු. 900.00 |
| මෙහෙයුම් අදියර | රු.1 ,250.00 |
| කළමනාකරණ අදියර | රු.2,000.00 |
| උපායමාර්ග අදියර | රු.3,000.00 |
| විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | රු.4,000.00 |

8.2. විභාගපෙර සම්මන්ත්‍රණ

විභාග ගාස්තු විභාග පෙර සම්මන්ත්‍රණ සඳහාද වේ.මෙම සම්මන්ත්‍රණ සෑම විභාගයකටම පෙර උපායමාර්ග අදියර හා විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය සඳහා පැවැත්වේ.

මැයි විභාගය සඳහා අප්‍රේල් මසද
නොවැම්බර් විභාගය සඳහා - ඔක්තෝබර් මසද වේ.

## 9. නිදහස් කිරීම්

### 9.1 නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය

නිදහස්කිරීම් සඳහා පහත සඳහන් නීති රීති බලපැවැත්වේ.
නිදහස්කිරීම් සහනයක් වනඅතර ආයතනයේ කැමැත්ත මත පමනක් ලබාදෙනු ඇත.ස්වයංක්‍රීය නිදහස් කිරීම් නොමැත.සුදුසුකම සඳහා අවශ්‍ය තරම් ක්ෂේත්‍රයක් ආවරණය වී නොමැත්තේ නම් නිදහස්කිරීම් ලබා නොදෙනු ඇත

.

පොදුවේ නිදහස් කිරීම් ලබාදෙනුයේ සුදුසුකම සම්පූර්ණ කල පසු පමණකි. වෙනත් වෘත්තීය සුදුසුකම් සඳහා පමණක් අර්ධ සුදුසුකම් සලකා බැලේ.විශේෂ අවශ්‍යතාවක් මත හැරෙන්නට විෂයයෙන් විෂය නිදහස් කිරීම නිර්දේශ නොකෙරේ.

ආයතනය නිදහස්කිරීම් සඳහා නිදහස්කිරීම් නොකරනු ඇත.සුදුසුකම් විමර්ෂනය කිරීම සඳහා මුල් සුදුසුකම්වල පිටපත් ඉදිරිපත් කලයුතුය.

ආයතනයේ විභාගවලදී අසමත්වූ විෂය සඳහා නිදහස්කිරීම් නොකරනු ඇත.

ශිෂ්‍යයකුට නිදහස් කිරීම සඳහා එක ඉල්ලුම්පතක් පමණක් එවිය හැකි අතර ඔහු / ඇය කලින් සුදුසුකම සම්පූර්ණකිරීමෙන් පසුව හෝ වෙනත් සුදුසුකමක් පසුව ලබාගත හොත් දෙවන ඉල්ලුම්පතක් ඉදිරිපත් කල හැකිය.එහිදී පලමු ලිපිය ඉදිරිපත් කලයුතුය.

නිදහස්කිරීම් සඳහා විද්යුත් තැපෑලෙන් හෝ පැක්ස් මගින් එවන ඉල්ලීම් හෝ ලේඛණ සලකාබලනු නොලැබේ.

ආයතනය වෘත්තීය පලපුරුද්ද සඳහා නිදහස්කිරීම් නොකරයි.

විද්යුත් අධ්‍යාපන සහතික නිදහස්කිරීම් සඳහා සලකා නොබැලේ.ඒවා අත්සන් හා මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.

ආයතනය නිදහස්කිරීම් සඳහා සුදුසුකම් ලැයිස්තුවක් දී ඇත.ඕනෑම අවස්ථාවක එය වෙනස් කිරීමේ බලය ආයතනය සතුය.

කිසිම අයදුම්පතක් අවශ්‍ය ලෙස සකසා නොමැත්තේ නම් සලකා නොබැලේ.

### 9.2 නිදහස් කිරීම සඳහා අයදුම්පත

ඔබ නිදහස්කිරීම් සඳහා සුදුසුදැයි දැනගැනීම පිණිස නිදහස්කිරීම් ලැයිස්තුව බලන්න.ඔබේ සුදුසුකම එහි නොමැති වුවද ඔබ සුදුස්සෙක් වියහැකිය.

නිදහස් කිරීම් සඳහා පහත පියවරයන් අනුගමනය කරන්න.
1. ආයතනයේ නිදහස්කිරීමේ ප්‍රතිපත්තිය හා සුදුසුකම් බලන්න.
2. මුලින් ආයතනයේ ලියාපදිංචි වීමට කටයුතු කරන්න.
3. ඔබ නිහස්වීමට සුදුසුනම් ඉල්ලුම් කරන්න.

පහත සඳහන් ලේඛණ ඉදිරිපත් කරන්න.

අ. සම්පූර්ණ කල නිදහස් කිරීමේ ඉල්ලුම්පත. මෙය අප වෙබ් අඩවියෙන්ද ලබාගත හැක.
ආ. අදාල සහතිකවල සහතික කල පිටපත්.
ඇ. කලින් ලබාගත් නිදහස්කිරීමේ ලිපි පිටපත්.

මෙම ලියවිලි මැයි විභාගයට නම් පෙබරවාරි 15 ට පෙරද
නොවැම්බර් විභාගයට අදාලව නම් අගෝස්තු15 ට පෙරද එවිය යුතුය.

4. ඔබ නිදහස් කිරීමට සුදුසුනම් ඒ බව සති තුනක් ඇතුලත ඔබට දන්වනු ඇත.
5. ගෙවීම්කර නිදහස්වීම් ලබාගන්න. මෙය වෙබ් අඩවියෙන්ද ලබාගත හැක.

ඔබ වෙත ලිපිය ලැබීමෙන් පසු ගෙවීම් කර ඉල්ලුම් කිරීමට පහත පරිදි කටයුතු කරන්න.
අ. නිදහස් කිරීම සඳහා ගෙවීම් පෝරමය මෙය වෙබ් අඩවියෙන්ද ලබාගත හැක.
ආ. ආයතනය විසින් එවන ලද ලිපියේ පිටපතක්
ඇ. ගෙවීම් කල බවට විශේෂ ගෙවීම් වවුචරයේ ශිෂ්‍ය පිටපත ආයතනය වෙත එවන්න.

නිදහස්කිරීම් ලබාගැනීමට පෙර ආයතනයේ ලියාපදිංචි වීමට කටයුතු කරන්න.

මැයි විභාගයට පෙනීසිටීමට නම් මාර්තු 1 ට පෙරද
නොවැම්බර් විභාගයට පෙනීසිටීමට නම් සැප්තැම්බර් 1 ට පෙරද එවීමට කටයුතු කරන්න.

6. නිදහස් කිරීම වලංගුවන්නේ ගෙවීම් කිරීමෙන් පසුවය.

නිදහස් කිරීම සඳහා ඉල්ලීමේ ලිපිය ශිෂ්‍ය ලියාපදිංචි ඉල්ලුම්පතට පෙරද අදාල ලිපි ලේඛණ සමඟ එවිය හැක.

සම්පූර්ණ කල 'නිදහස් කිරීමේ ඉල්ලුම්පත' එම ලියාපදිංචි ශිෂ්‍යයින් විසින් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

9.3 <u>නිදහස් කිරීමේ ගාස්තු</u>

| අදියර | විෂයකට |
| --- | --- |
| පදනම් අදියර | රු. 900.00 |
| මෙහෙයුම් අදියර | රු.1,250.00 |
| කලමනාකරණ අදියර | රු.2,000.00 |
| උපායමාර්ගික අදියර | රු.3,000.00 |
| විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | රු. 4,000.00 |

## විභාග සහ නිදහස් කිරීම.

| සුදුසුකම් | පදනම් අදියර | මෙහෙයුම් | කලමනාකරණ | උපායමාර්ග |
|---|---|---|---|---|
| ඒඒටී අවසාන විභාගය | සම්පූර්ණයෙන් | නැත. | නැත. | නැත. |
| ගණකාධිකරණ ඩිප්ලොමා වසර 2 | සම්පූර්ණයෙන් | FAR & AMA | නැත. | නැත. |
| උසස් ජාතික ගණකා. ඩිප්ලොමා වසර 4 | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | නැත. | නැත. |
| වාණිජ ඩිප්ලෝමාව | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | නැත. | නැත. |
| ගණකාධිකරන විශේෂ උපාධිය | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | විෂයෙන් විෂය පදනමට | නැත. |
| වාණිජ උපාධිය | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | නැත. | නැත. |
| ව්‍යාපාර පරිපාලන උපාධිය | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | නැත. | නැත. |
| බැංකු අවසාන විභාගය | සම්පූර්ණයෙන් | විෂයෙන් විෂය | පදනමට | නැත. |
| වරලත් ලේකම් හා පරිපාලකයන්ගේ ආයතනයේ අවසාන විභාගය | සම්පූර්ණයෙන් | විෂයෙන් විෂය | පදනමට | නැත. |
| වරලත් අලෙවි කරන ආයතනය (CIM) | සම්පූර්ණයෙන් | විෂයෙන් විෂය | පදනමට | නැත. |
| වරලත් ගණකාධිකාරි ආයතණය (ICA) | සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් | SBM හැර සම්පූර්ණයෙන් | SMA හැර සම්පූර්ණයෙන් |
| වරලත් සහතිකලත් ගණකාධිකාරි සංගමය (ACCA) | සම්පූර්ණයෙන් | නීතිය හා බදුකරණය හැර සම්පූර්ණයෙන් | නීතිය හා බදුකරණය හැර සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් |
| වරලත් කළමණාකරණ ගණකාධිකාරි ආතනය (CIMA) | සම්පූර්ණයෙන් | නීතිය හා බදුකරණය හැර සම්පූර්ණයෙන් | නීතිය හා බදුකරණය හැර සම්පූර්ණයෙන් | සම්පූර්ණයෙන් |

වෘත්තීය, විශව විද්‍යාල සහ අනෙකුත් අර්ධ සුදුසුකම් වෙන වෙනම සලකා බලනු ඇත.
අභ්‍යන්තර හා භාහිර උපාධිවල වෙනසක් නොසැලකේ

සිංහල හෝ දෙමල මාධ්‍ය උපාධි සඳහා නිදහස් කිරීම් කරනු ලබන්නේ පලමු අදියර දෙක සඳහා පමණි. මාධ්‍ය සඳහන්කර නොමැත්තේ නම් එය ඉංග්‍රීසි මාධ්‍ය ලෙස නොසලකනු ලැබේ.

උපාධි අපේක්ෂකයින්ගේ නිදහස්කිරීම් සලකාබලනු ලබන්නේ විෂයෙන් විෂය පදනමටය.

උපාධි පාඨමාලාවක පලමු වසර සමත්වුවන් සඳහා විෂයයන් සමානවුවද මෙහෙයුම් අදියරේ නිදහස්කිරීම් කරනු නොලැබේ.

ආයතනය සලකා බලනු ලබන්නේ විශ්ව විද්‍යල ප්‍රතිපාදන කොමිසම විසින් පිලිගත් උපාධි පමණකි.

ආයතනය 2002 වසරට පෙර ලබාගත් උපාධි සලකා බලනු ලබන්නේ ඇගයීමකින් පසුවය.

## 10. ආශ්‍රිත කළමනාකරණ ගණකාධිකාරීන් කළමනාකරණ මට්ටමේ AMA පදවිනාමය

10.1. ආශ්‍රිත කළමනාකරණ ගණකාධිකාරී පදවිනාමය කළමනාකරණ මට්ටමේ ගණකාධිකරණ සුදුසුකමක් වේ.

මෙම පදවිනාමය සඳහා ඉල්ලුම්කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කලයුතුය.

පහත සඳහන් නිර්නායකයන් මත මෙම පදවිනාමය ප්‍රධානය කෙරේ.

1. ආයතනයේ අන්තර්මධ්‍ය/කළමනාකරණ අදියර විභාගය සමඟ වසර 2 ක පුහුණුව.
2. වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර්මධ්‍ය/ගි.ව්‍ය.ස 11 සමඟ උපායමාර්ග අදියරේ කළමනාකරණ ගණකාධිකරණය/ආයතනයේ උසස් කළමනාකරණ ගණකාධිකරණය /විෂයානුබද්ධ කළමනාකරණ ගණකාධිකරණය වසර 2 ක පුහුණුව
3. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ අදියරේ වෘත්තීය 1,4 හා 7 සමත්වී වසර 2 ක පුහුණුව.
4. වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ මූලධර්ම/නිපුණතා සහ දැනුම/විෂයයන් 9ක් හා වසර 2ක පුහුණුව.
5. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ ඩිප්ලෝමාව හෝ වාණිජ ඩිප්ලෝමාව සමඟ අප ආයතනයේ උසස් මූල්‍ය ගණකාධිකරණය සමත්ව වසර 2ක පුහුණුව
6. ගණකාධිකරණ උපාධිය/වසර 4/සමඟ වසර 2ක පුහුණුව

10.2. **AMA** සුදුසුකම සඳහා යොමුවීම.

**AMA** සුදුසුකම ලබාගත් අයට **CMA** උපායමාර්ග 1 අදියර හා සිද්ධි අධ්‍යයනය සඳහා පෙනී සිටිය හැක.

10.3. සැපයිය යුතු වාර්තා සහ ලේඛණ

10.4. ගාස්තු /වෙනස්වීමට ඉඩ ඇත/

අ. ලියාපදිංචි ගාස්තු රු. 3000.00
ආ. වාර්ෂික ගාස්තු රු. 2000.00

මෙම පදවි නාමය ලැබුවන් **CMA** විභාග සඳහා ලියාපදිංචි වී වාර්ෂික ගාස්තු ගෙවන්නේ නම් ඉහත වාර්ෂික ගාස්තු ගෙවියයුතු නැත.

වාර්ෂික ගාස්තු ගෙවා නොමැත්තේ නම් **AMA** සුදුසුකම අහෝසි වන අතර සහතිකය ආපසු දියයුතුය.

## 11. CMA පරිගණක මධ්‍යසථානය

ගණකාධිකාරි හා මූල්‍ය ක්ෂෙත්‍රයේ වෘත්තිකයන් වීමට බලා සිටින අයට නූතන කාර්යාලයක තොරතුරු තාක්ෂණ පරිසරයක පරිගණක සමඟ වැඩකිරීමේ හැකියාව අමතර නිපුනත්වයක් නොව අත්‍යවශ්‍ය නිපුණතාවකි. CMA ශ්‍රී ලංකා විසින් ගණකාධිකරණ හා මූල්‍ය ක්ෂෙත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි සකස් කල තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හැදෑරීමට අවසථාව ලබා දී ඇත.

<u>**පරිගණකගත ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**</u>

පරිගණක මධ්‍යසථානය “පරිගණකගත ගිණුම්කරණය පිලිබඳ සහතික පත්‍ර පෘඨමාලාව” සඳහා වෙන වෙනම අවධානය යොමු කල හැකි ජාල සම්බන්ධිත පරිසරයක පංති පවත්වනු ලැබේ. මාර්තු හා සැප්තැම්බර් මාස වල විභාග පැවැත්වේ.

අදියර I   තොරතුරු තාක්ෂණය, ගිණුම්කරණ භාවිතය I (ITA I)
පැය 2 ක ලිඛිත පරීක්ෂණය හා පැය 2 ක ප්‍රායෝගික පරීක්ෂණය

අදියර II   තොරතුරු තාක්ෂණය, ගිණුම්කරණ භාවිතය II (ITA II)
පැය 2 ක ලිඛිත පරීක්ෂණය හා පැය 2 ක ප්‍රායෝගික පරීක්ෂණය.

### පාඨමාලා අන්තර්ගතය (අදියර I හා අදියර II)

**SAGE ගිණුම්කරණ පැකේජය**

SAGE ගිණුම්කරණ පැකේජය බොහෝ ගණකාධිකාරි ආයතනවල ව්‍යාප්තව පව්ච්චි කරනු ලබන එක්සත් රජධානියේ පැකේජයකි.

**MS ඔෆිස්**

වර්ඩ්, එක්සෙල් - ඇක්සස්, පවර්පොයින්ට්, ඉන්ටනෙට් සහ ඊ මේල් (ඉන්ටනෙට් හා ඊ මේල් ප්‍රායෝගික පුහුණු පහසුකම් එක් එක් ශිෂ්‍යයන්ට දෙනු ලබන්නේ වෙන වෙනම පරිගණකවලය)

වින්ඩෝස් ඔපරේටින් සිස්ටම්

වැඩි විස්තර සඳහා කරුණාකර CMA ලේකම් කාර්යාලය අමතන්න.

## 12. **CMA** සුදුසුකම සඳහා පිලිගැනීම.

- **ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය - ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන උපාධිය (BMS)**

  වසර හතරක උපාධියකි. විභාග ව්‍යුහය 3 මට්ටම 4 වන මට්ටම 5 වන මට්ටම හා 6 වන මට්ටම වේ. 6 වන මට්ටමේ ශිෂ්‍යයනට අලෙවිකරණය හා මානව සම්පත් කළමණාකරණය විශේෂයන් හැදැරිය හැක. මෙය CMA වෘත්තිකයන්ට වෘත්තීය සුදුසුකම් සමග උපාධියක් ලබාගැනීමේ මහගු අවසථාවකි. CMA ශ්‍රී ලංකා අවසාන විභාගය සමතුන්ට BMS උපාධි වැඩ සටහනේ 5 වන මට්ටමේ ලියාපදිංචි විය හැක. ඔවුන් 3 හා 4 මට්ටම් වලින් නිදහස් කරණු ඇත.

  CMA හි අන්තර් මධ්‍ය /මෙහෙයුම් අදියර හෝ වෘත්තීය / උපායමාර්ග, අදියර සමත් ශිෂ්‍යයන්ට 5 වන මට්ටමේ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි විය හැක. (ඔහු/ඇය cma වෘත්තීය I හා II / කලමනාකරණ හා උපායමාර්ග අදියර සම්පූර්ණ කල යුතු අතර 6 වන මට්ටමට වාඩිවීමට පෙර 3 හා 4 මට්ටම් වලින් නිදහස් විය හැකිය.)

  විවෘත විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ අධ්‍යයන වැඩ සටහන් වන “පරිගණක ශාසත්‍රය” සහ “අධ්‍යයන කටයුතු සඳහා ඉංග්‍රීසි” යන වැඩ සටහන් වලට සහභාගිවී එම නිර්නායකයන් සැපිරිය යුතුය.
  විශ්ව විද්‍යාලය මෙම වැඩසටහන පෙබරවාරි මස ආරම්භ කරන අතර ඒ සඳහා ඉල්ලුම්පත් කලින් වර්ෂයේ නොවැම්බර් මස 30 වන දිනට පෙර ඉදිරිපත් කලයුතුය.ඉල්ලුම්පත CMA කාර්යාලයෙන් ලබාගතහැක.ඇතුල්වීම හා අදල ගෙවීම් ශ්‍රී ලංකා විවෘත විශව විද්‍යාලයේ උපදෙස් පරිදි කළ යුතුය.පහත සඳහන් ලයවිලිවල පිටපත් ඉදිරිපත් කලයුතුය.

  CMA ලියාපදිංචි ලිපිය
  ජාතික හැඳුනුම්පත
  CMA ප්‍රථිපල ලේඛන

  අ.පො.ස. සා.පෙල / උ.පෙල සහතික

  වෙනත් සුදුසුකම්

  පලපුරුද්ද

  ඉල්ලුම්පත් CMA විසින් විවෘත විශ්ව විද්‍යාලය වෙත යවනු ඇත.

- **ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (ICASL)**

  CMA අවසාන විභාග සමත් වූවනට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පදනම් විභාගයෙන් / **CAB 1** හා අන්තර් මධ්‍ය විභාගයේ විගණනය හා පරිචය විෂයයෙන් හැර අනෙකුත් විෂයන්ගෙන් නිදහස් විය හැකිය.

- **සහතිකලත් වරලත් ගණකාධිකාරි සංගමය (ACCA, UK)**

  CMA ශිල්පීය/ පදනම් අදියර සමත් ශිෂ්‍යනට වරලත් සහතිකලත් ගණකාධිකාරි සංගමයේ ලියාපදිංචි විය හැකිය. අන්තර් මධ්‍ය /මෙහෙයුම් අදියර හෝ වෘත්තීය I / කලමනාකරණ අදියර හෝ වෘත්තීය II / උපාය මාර්ග අදියර සමත් වූවනට විෂයෙන් විෂය පදනම යටතේ නිදහස්වීම් ලබාගත හැකිය.

- **සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින් - CMA බ්‍රිතාන්‍ය කොලොම්බියා - කැනඩා සහ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරින් - CMA ඔන්ටාරියෝ කැනඩා**
  ශිෂ්‍යයන්ට විෂයෙන් විෂය පදනම යටතේ නිදහස් වීම් ලබාගත හැක. සාමාජිකයින් හා අවසාන විභාගය සමත් වූවන්ට කැනඩාවේ CMA කාර්යාල ඇති තෝරාගත් දිස්ත්‍රිස්කවලින් නිදහස්වීම් ඉල්ලූම් කළ හැකිය.

- ඔන්ටාරියෝ හි සහතිකලත් පොදු ගණකාධිකාරින් (CGA- කැනඩා)
- සාමාජිකයින් හෝ අවසාන විභාගය සමත් වූවන් CGA - ඔන්ටාරියෝ වල විෂයයන් 12 කින් නිදහස්වීමට සුදුසුකම් ලබති. මෙම විෂයයන් www.cga-ontario.org වෙබ් අඩවියෙන් ලබාගත හැක.
- වරලත් කලමනාකරණ ගණකාධිකාරී ආයතනය ICMA UK
- මූල්‍ය ගනකාධිකාරී ආයතනය IFA UK
- සහතික ලත් පොදු ගණකාධිකාරීන් CPA AUSTRALIA
- ඩෙයිකින් විශ්ව විද්‍යාලය ඕස්ට්‍රේලියාව
- පහත සඳහන් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්ද අත්සන්කර ඇත.
  ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
  සමස්ත ඉන්දියා කලමනාකරණ ආයතනය AIMA INDIA
  පිරිවැය හා වැඩ ගණකාධිකාරී ආයතනය ඉන්දියාව ICWA INDIA
  පිරිවැය හා කලමනාකරණ ගණකාධිකාරී ආයතනය පකිස්තානය ICMA PAKISTAN
  පිරිවැය හා කලමනාකරණ ගණකාධිකාරී ආයතනය බංගලාදේශය ICMA BANGLADESH
  උසස් තාක්ෂණ අධ්‍යයන ශ්‍රී ලංකා ආයතනය SLIATE

## 13. ප්‍රායෝගික පුහුණු සුපරීක්ෂණ වැඩසටහන

13.1 අරමුණු

ප්‍රායෝගික පුහුණු වැඩසටහනේ අරමුණ වන්නේ ආයතනයේ සාමාජිකයින් කළමනාකරණ හා මූල්‍ය ගණකාධිකරණ මූලධර්ම, කලමනාකරණය,වාණිජ්‍ය,මූල්‍ය,නීති සහ නීතිමය කටයුතු කිරීමේ දැනුම සැකැසුම හා උපායමාර්ගික කලමනාකරණය සඳහා ඉදිරියට යන සේව්‍යයකුට උපකාරකිරීමයි.

13.2 පුහුණු කාලය
පාලක මණ්ඩලය නිකුත්කර ඇති උපදෙස් පරිදි වසර 3 ක ප්‍රායෝගික පුහුණුව ව්‍යාපාර පරිසරයක හෝ අනුමත කල ක්ෂෙත්‍රයක විභාග වලට සුදුනම් වන ගමන් හෝ විභාග සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා ගත හැකිය. පහත සඳහන් ක්ෂෙත්‍ර ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා පිලිගෙන ඇත.විභාග සමත්වීමට ප්‍රථම ලබාගත් පුහුණුව වෙනවෙනම සලකාබලනු ලැබේ.

1. නිෂපාදන කර්මාන්ත
2. වාණිජ හා වෙළඳ
3. බැංකු, මූල්‍ය හා රක්‍ෂණ
4. අධ්‍යාපන
5. වැවිලි, කෘෂිකර්ම, ධීවර, ඉදිකිරීම් හා පතල්
7. ප්‍රවාහන - සමාජ හා උපයෝගිතා සේවා
6. රාජ්‍ය අමාත්‍යාංශ - දෙපාර්ථමේන්තු රාජ්‍ය සංසථා - ව්‍යවස්ථාපිත මණාඩල
8. සේවා (හෝටල් - ආරෝග්‍යශාලා - රාජ්‍ය නොවන සංවිධාන)
9. විගණන හා කලමණාකරන උපදේශන සේවා
10. තොරතුරු තාක්‍ෂණ හා මෘදුකාංග

ඉහත අංශවලට නොවැටෙන අංශයක පුහුණුවන අයකු ඇතොත් කරුනාකර ලේකම් කාර්යාලය විමසන්න.

13.4 පුහුණු සුපරීක්ෂණ වැඩසටහනට අයත්වන අංශ

ප්‍රායෝගික පුහුණු සුපරීක්ෂණ වැඩසටහනට අයත්වන අංශ

| සංකේත | දින ගනන | පැයගනන |
|---|---|---|
| 1. මූල්‍ය ගණකාධිකරණ මූලධර්ම හා වාර්ථාකරණ රාමුව | 165 | 1320 |
| 2. කලමනාකරණ ගිණුම්කරණ,තීරණ ගැනීම හා කලමනාකරණ තොරතුරු තාක්ෂණ ක්‍රම | 330 | 2640 |
| 3. උපායමාර්ග කලමනාකරණය | 165 | 1320 |

ශිෂ්‍යයන් කලමනාකරණ ගිණුම්කරණය සම්බන්ධ පුහුණුව මාස 18 ක් බව මේ අනුව පෙනේ. මෙයින් ආයතනයේ සාමාජිකත්වය සඳහා ප්‍රධාන විෂය පථය කුමක්ද යන්න පෙන්වා දෙයි. එනම් කලමනාකරණ ගිනුම්කරනයථතීරණ ගැනීම, කලමනාකරණ තොරතුරු තාක්ෂනය සහ උපායමාර්ග කලමනාකරණයයි. මුලු කාලය වසර 3කි.

වැඩි විස්තර සඳහා පුහුණු සුපරීක්ෂණ වැඩසටහන පොත බලන්න.

## 14. විභාග සහතික

එක් එක් අදියර සම්පූර්න කල ශිෂ්‍යයන්ට ප්‍රථිපල සටහනට අමතරව පහත සඳහන් පරිදි සහතිකපත් පිරිනමනු ලැබේ.

1 පදනම් අදියර

*ප්‍රධානය :- ගිනුම්කරණ හා ව්‍යපාර අධ්‍යයනය පිලිබඳ CMA සහතිකය*

2 මෙහෙයුම් අදියර

*ප්‍රධානය :- ගිනුම්කරණ හා ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ CMA ඩිප්ලෝමා සහතිකය*

3 කලමනාකරණ අදියර

*ප්‍රධානය :- ආශ්‍රිත කලමනාකරණ ගිණුම්කරණ CMA සහතිකය (AMA)*

4 උපායමාර්ගික අදියර සහ 5 අදියර විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය

*ප්‍රධානය :- CMA අවසාන සහතිකය*

වසර 3 ක ප්‍රායෝගික පුහුණුව සහ සම්මුඛ පරීක්ෂනය
*ප්‍රධානය CMA සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරි ආයතනයේ CMA පහත පරිදි සාමාජික සහතිකය*

*සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරි ආශ්‍රිත සාමාජිකත්වය (ACMA)*

සමාජිකත්වය ලැබීමෙන් පසු වසර 5ක් හා *CPD* අවශ්‍යතාවන් සම්පූර්න කිරීමෙන් පසු

*සහතිකලත් කලමනාකරණ ගණකාධිකාරි අධි සාමාජිකත්වය (FCMA )*

## 15. ශිෂ්‍යත්ව

**ඉතාම දක්ෂ පාසැල් හැරයන්නන්,විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් හා උසස් තාන්ෂණ ආයතනයේ ශිෂ්‍යයන් හා රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ වැඩකරණ ශිෂ්‍යයන් සඳහා CMA ශිෂ්‍යත්ව පිරි නැමේ.**

සියළුම තෝරාගැනීම් පාලක සභාව විසින් පත්කරනු ලබන කමිටුවක් මගින් සිදු කරනු ලබන අතර පාලක මණ්ඩලයේ අනුමතිය ලැබීමෙන් පසු කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.
පාලක මණඩලය මගින් නියම කර ඇති නිර්නායකයන් සම්පූර්ණ කරීම මත දෙනු ලබන ශිෂ්‍යත්ව ප්‍රමාණය තීරණය වේ.

<u>ශිෂ්‍යත්වයන්ට පහත සඳහන් දෑ ඇතුලත්ය.</u>

1. ලියාපදිංචි ගාස්තු හා වසර 3 ක් සඳහා වාර්ෂික දයක ගාස්තු
2. සියලුම අදියරයන් සඳහා අධ්‍යයන පාඨමාලා
3. සියලුම අදියරයන් සඳහා පලමු ප්‍රයත්නයේ දේශන ගාස්තු
4. පලමු ප්‍රයත්නය සඳහා විභාග ගාස්තු
5. ප්‍රායෝගික පුහුණුව සඳහා ආයතනයක් ලබාගැනීමට උපකාරිවීම.

ඉහත කුමන යෝජනා ක්‍රමයක් යටතේ හෝ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට කැමති අය ශිෂ්‍යයන් වශයෙන් ලියාපදිංචි වී සිටිය යුතු අතර විධායක අධ්‍යක්ෂවරයාගෙන් ලබාගන්නා ශිෂ්‍යත්ව ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර අදල අවසාන දිනට පෙර ඉදිරිපත් කල යුතුය.

## 16. ත්‍යාග

එක් එක් අදියරේදී ත්‍යාග පිරිනමනු ලැබේ. තමන්ගේ පලමු ප්‍රයත්නයේදී ඉහලම ලකුණු ලබාගෙන විශිෂ්ඨ සාමාර්ථයක් ලත් ශිෂ්‍යයන්ට අදල විෂය සඳහා විෂය ත්‍යාග පිරිනමනු ලැබේ. පලමු ප්‍රයත්නයේදී ඉහලම විශිෂ්ඨ සාමාර්ථ තත්වයේ මුලු ලකුණු ලබාගත් පලමු හා දෙවන ශිෂ්‍යයනට දක්ෂතා අනුපිලිවෙල මත කුසලතා ත්‍යාග පිරිනමනු ලැබේ.සියලුම අදියර වලදී උසස් ලකුණු ලබා අවසාන අදියරේදී ඉහලම ලකුණු ලබන ශිෂ්‍යයන් ආරම්භක සභාපති ප්‍රධානය ලෙස රන් තිළිණ සඳහා සුදුසුකම් ලබයි.

## 17. සංක්‍රාන්ති නියමයන්

නව විෂය නිර්දේශය 2012 සිට ක්‍රියාත්මක වන අතර එහි පලමු විභාගය 2012 මැයි මාසයේ පැවැත්වේ

කලින් විෂය නිර්දේශයේ අදියර/විෂයයන් හා අදාලවන නව විෂය නිර්දේශයේ අදියර/අධ්‍යයන ඒකක ඒ ඒ අදියර යටතේ දක්වා ඇත.

පැරණි නිර්දේශයේ සමත්වූ හෝ නිදහස්වූ විෂයයන්ට අදාල නව නිර්දේශයේ විෂයයන් සමත්වූ හෝ නිදහස්වූ ලෙස සලකනු ලැබේ.

අදාල නිර්නායකයන් සපුරා ඇත්නම් ශිෂ්‍යයන්ට අදියර 1,2,3 හි විෂයයන්, විෂයයෙන් විෂය ඉල්ලුම් කිරීමට ඉඩදෙනු ලැබේ.

එක් එක් අදියර අවසන සටහන් හා පාලක සභාව විසින් කරනු ලබන ප්‍රධානයන් සටහන් කර ඇත.

**පැරණි නිර්දේශය** **නව නර්දේශය 2012**

| තාක්ෂණික අදියර | අදියර I පදනම් අදියර | විෂය සංකේතය |
|---|---|---|
| කලමනාකරණ ගිනුම්කරණ මූලධර්ම MAF/502 | කලමනාකරණ ගිනුම්කරණ මූලධර්ම | MAF/FL 1 |
| මූල්‍ය ගිණුම්කරණ මූලධර්ම FAF/501 | මූල්‍ය ගිණුම්කරණ මූලධර්ම | FAF/FL 2 |
| ව්‍යාපාර ගණිතය BMT/503 | ව්‍යාපාර ගණිතය හා සංඛ්‍යානය | BMS/FL 3 |
| - | කලමනාකරණය,සාංගමික පාලනය හා චර්යා ධර්ම | MGE/FL 4 |
| ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර ව්‍යාපාර ECN/505 | ව්‍යාපාර ආර්ථික විද්‍යාව හා ව්‍යාපාර මූල්‍ය මූලධර්ම | BEF/FL 5 |
| ව්‍යාපාර සංනිවේදනය I ඉංග්‍රීසි භාෂාව BCI/514 | ව්‍යාපාර ඉංග්‍රීසි I | BE I/SK 1 |
| ව්‍යාපාර සංනිවේදනය BCN/504 | ව්‍යාපාර ඉංග්‍රීසි II : අදියර 2මෙහෙයුම් අදියර | BE II/SK 2 |

**සටහන්**

1. පැරණි නිරදේශයේ තාක්ෂණික අදියර සමත් ශිෂ්‍යයින් නව නිර්දේශයේ පදනම් අදියර සම්පූර්ණ කලා සේ සැලකේ.

2. නව නිර්දේශයේ මෙහෙයුම් අදියරේ මෙහෙයුම් කලමණාකරණ ගිණුම්කරනය OMA/OL I හා මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය FAR/OL 2 වාඩිවීම සඳහා පැරණි නිර්දේශයේ යෝ නව නිර්දේශයේ කලමනාකරණ ගිණුම්කරණ මූලධර්ම MAF/FL 1 හා මූල්‍ය ගිණුම්කරණ මූලධර්ම FAF/FL 2 සමත්වී හෝ නිදහස්වී සිටිය යුතුය.

3. නව නිර්දේශයේ ශිෂ්‍යයන් ව්‍යාපාර ඉංග්‍රීසි II ට වාඩිවීමට පෙර ව්‍යාපාර ඉංග්‍රීසි I සමත්වී හෝ නිදහස්වී සිටිය යුතු අතර වෘත්තීය සංනිවේදනය PC/SK 4 ට වාඩිවීමට පෙර ව්‍යාපාර ඉංග්‍රීසි II සමත්වී හෝ නිදහස්වී සිටිය යුතුය.

4. ශිෂ්‍යයන් නව නිර්දේශයේ කලමනාකරණය, සාංගමික පාලනය හා චර්යා ධර්ම ඇතුලුව සියලුම විෂයයන් අදියර I සම්පූර්ණ කිරීම සඳහා සමත්වී හෝ නිදහස්වී සිටිය යුතුය.

අදියර I සම්පූර්ණ කිරීමෙන් පසු CMA ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ සහතිකය ප්‍රධානය කරනු ලැබේ.

| පැරණි නිර්දේශය | නව නිර්දේශය 2012 | |
|---|---|---|
| **අන්තර් මධ්‍ය අදියර** | **අදියර 2 මෙහෙයුම් අදියර** | **විෂය සංකේත** |
| උසස් කලමනාකරණ ගිනුම්කරණය (AMA/602) | මෙහෙයුම් කලමනාකරණ ගිනුම්කරණය | OMA/OL 1 |
| මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය (FAR/601) | මූල්‍ය ගිනුම්කරණය හා වාර්තාකරනය | FAR/OL 2 |
| මෙහෙයුම් කලමනාකරණය (OMM 1/703) – P I | මෙහෙයුම් හා තොරතුරු පද්ධති කලමනාකරණය | OIM/OL 3 |
| තොරතුරු තාක්ෂණ කලමනාකරණය (ITM/705) – P I | | |
| ව්‍යාපාර හා සාංගමික නීතිය (BCL/604) | ව්‍යාපාර නීතිය හා බදුකරණය | BLT/OL 4 |
| බදුකරණය (TAX/605) | | |
| ව්‍යාපාර සංනිවේදනය II (BC II/616) | ව්‍යාපාර ඉංග්‍රීසි II | BE II/SK 2 |
| - | තොරතුරු තාක්ෂණ භාවිතය | ITA/SK 3 |

සටහන

1. පැරණි නිර්දේශයේ බදුකරණය (TAX/605) හා ව්‍යාපාර හා සාංගමික නීතිය (BCL/604) යන දෙකම සමත් හෝ නිදහස්වූ ශිෂ්‍යයන් නව නිර්දේශයේ ව්‍යාපාර නීතිය හා බදුකරණය (BLT/OL 4) සමත්වූ ලෙස සලකනු ලැබේ.අනෙකුත් අය ව්‍යාපාර නීතිය හා බදුකරණය විෂය BLT/OL4 සමත්විය යුතුය.

2. පැරනි නිර්දේශයේ වෘත්තීය 1 අදියරේ මෙහෙයුම් කලමනාකරණය (OMM1/703) හා තොරතුරු තාක්ෂණ කලමනාකරණය (ITM/705) යන දෙකම සමත් හෝ නිදහස් වූ ශිෂ්‍යයන් නව නිරදේශයේ මෙහෙයුම් හා තොරතුරු පද්ධති කලමනාකරණය(OIM/OL 3 ) සමත්වූවන් ලෙස සලකනු ලැබේ. (ITA/SK 3).

3. නිපුනතා අධ්‍යයන ඒකක - තොරතුරු තාක්ෂණ භාවිතය. (ITA/SK 3).

   30% න්‍යාය. පැයක ප්‍රශ්න පත්‍රයකි.පැරණි නිර්දේශයේ තොරතුරු තාක්ෂණ කලමනාකරණය ITM/705 සමත්වූ හෝ නිදහස්වූ ශිෂ්‍යයන් හෝ නව නිර්දේශයේ මෙහෙයුම් හා තොරතුරු පද්ධති කලමනාකරණය OIM/OL3 එ සමත්වූ හෝ නිදහස්වූ ශිෂ්‍යයන් මෙම න්‍යාය කොටස සමත්වූ ලෙස සලකනු ලැබේ.

   70% ප්‍රායෝගික.මෙම කොටස පැය 2 ක කාලයක් වන අතර එය ආයතනයේ අනුමත ආයතනවලදී පවත්වනු ලැබේ.

   අදියර 2 සමත්වීමෙන් පසු ශිෂ්‍යයන් වෙත ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යයනය පිලිබඳ CMA ඩිප්ලොමා සහතිකය ප්‍රධානය කරනු ලැබේ.

**පැරණි නිර්දේශය** **නව නිර්දේශය 2012**

| වෘත්තීය I අදියර | අදියර 3 කලමනාකරණ අදියර | විෂය සංකේතය |
|---|---|---|
| - | විෂයානුබද්ධ කලමනාකරණ ගිණුම්කරණය | IMA/ML 1 |
| උසස් මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය (AFA/701) | සාංගමික වාර්තාකරණය හා විග්‍රහය | CRA/ML 2 |
| අලෙවිකරණය හා මානව කලමනාකරණය (OMM II/704) හා (MPO/603) | අලෙවිකරණය හා මානව කලමනාකරණය | MPM/ML 3 |
| - | සාංගමික නීතිය හා උසස් බදුකරණය | CLT/ML 4 |
| - | වෘත්තීය සංනිවේදනය | PC/SK 4 |
| තොරතුරු තාක්ෂණ කලමනාකරණය (ITM/705) | මෙරෙයුම් හා තොරතුරු පද්ධති කලමනාකරණය | OIM/OL 3 |
| | තොරතුරු තාක්ෂණ භාවිතය | ITA/SK 3 |
| උපායමාර්ගික ව්‍යාපාර කලමනාකරණය (SBM/702) | ව්‍යාපාර උපායන් හා ප්‍රතිපත්ති | BSP/SL 2 |

සටහන්

1. වෘත්තීය 1 සමත් ශිෂ්‍යයන් ඇතුලුව නව නිර්දේශයේ අදියර 3 සමත්වීම සඳහා විෂයානුබද්ධ කලමනාකරණ ගිනුම්කරණය (IMA/ML I) ශිෂ්‍යයන් විසින් සමත්විය යුතුය.
2. පැරණි නිර්දේශයේ වෘත්තීය 1 අදියරේ අලෙවිකරණය (OMM2/704) අන්තර්මධ්‍ය අදියරේ මානව කලමනාකරණය හා සංවිධාන කලමනාකරණය (MPO/603) යන දෙකම සමත් ශිෂ්‍යයන් නව නිර්දේශයේ අදියර 3 හි අලෙවිකරණය හා මානව කලමනාකරණය (MPM/ML 3) සමත්වූ ලෙස සලකනු ලැබේ.
3. නිපුනතා අධ්‍යයන ඒකකයක්වන වෘත්තීය සංනිවේදනයට (PC/SK 4) වාඩිවීම සඳහා ඉඩදෙනු ලබන්නේ ව්‍යාපාර ඉංග්‍රීසි I (BE I/SK I) හා II (BE II/SK II) සමත් ශිෂ්‍යයනට පමණි.
4. ශිෂ්‍යයන් අදියර 3 සම්පූර්ණ කිරීම සඳහා වෘත්තීය සංනිවේදනය PC/SK 4 සමත්විය යුතුය.

අදියර 3 සම්පූර්ණ කිරීමෙන් පසු ශිෂ්‍යයනට CMA ආශ්‍රිත කලමනාකරණ ගණකාධිකාරී AMA සහතිකය ප්‍රධානය කරනු ලැබේ.

**පැරණි නිර්දේශය** **නව නිර්දේශය 2012**

| වෘත්තීය 11 අදියර | අදියර 4 උපායමාර්ගික අදියර | විෂය සංකේතය |
|---|---|---|
| උපායමාර්ග කලමනාකරණ ගිණුම්කරණය (SMA/803) | අපායමාර්ග කලමනාකරණ ගිණුම්කරණය | SMA/SL 1 |
| උපායමාර්ග ව්‍යාපාර කලමනාකරණය (SBM/702) | ව්‍යාපාර උපායන් හා ප්‍රතිපත්ති | BSP/SL 2 |
| උපාමාර්ග මූල්‍ය කලමනාකරණය (SFM/802) | මූල්‍ය උපායන් හා ප්‍රතිපත්ති | FSP/SL 3 |
| අභ්‍යන්තර පාලනය හා අවධානම් කලමනාකරණය (ICR/801) | අවධානම් හා පාලන උපායන් හා ප්‍රතිපත්ති | RSP/SL 4 |

සටහන්

1. අදියර 4 සඳහා වාඩිවීමට ඉඩදෙනු ලබන්නේ සියලුම පෙර අදියරයන් සමත්වීමෙන් පසුවය.
2. ශිෂ්‍යයන් පලමු වතාවේ සියලුම විෂයයන්ට පෙනීසිටිය යුතු අතර අතුරු වතාවලදී තම කැමැත්ත මත වියයන් තෝරාගත හැකිය.
3. සමහර විෂයයන් සමත්වී හෝ නිදහස්වී ඇති ශිෂ්‍යයන් ඉතුරු සියලුම විෂයයන්ට පලමු වතාවේ වාඩිවිය යුතුය.

**පැරණි නිර්දේශය** **නව නිර්දේශය 2012**

| සිද්ධි අධ්‍යයනය | අදියර 5 | විෂය සංකේතය |
|---|---|---|
| සිද්ධි අධ්‍යයනය | විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය | |

සටහන්

1. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනයට වාඩිවිය හැක්කේ අනෙකුත් අදියර 4 සමත්වීමෙන් පසුවය.

2. විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය නිර්නායක 1, නිර්නායක 2 හා ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.නිර්නායක 1 ආයතනයේ වෙබ් අඩවියේ විභාගයට මාස 2 1/2 කට පෙර ප්‍රසිද්ධ කරනු ලැබේ.

3. නිර්නායක 2 නිර්නායක 1 හිම කොටසක්වන අතර එය විභාගයේදී ප්‍රශ්න පත්‍රය සමග දෙනු ලැබේ.

අදියර 4 හා විෂයානුබද්ධ සිද්ධි අධ්‍යයනය සම්පූර්න කිරීමෙන් පසු ශිෂ්‍යයනට CMA අවසාන සහතිකය ප්‍රධානය කරනු ලැබේ.

<u>අධ්‍යයන පෙළපොත් ගාස්තු / වෙනස්වීමට ඉඩ ඇත.</u>

| *පාඨමාලාව / විෂය* | *විෂය සංකේතය* | *මාධ්‍යය* | |
|---|---|---|---|
| | | ***English*** | ***Sinhala*** |

**Level 1 Foundation Level**

| | | **Rs.** | **Rs.** |
|---|---|---|---|
| FL 1 Management Accounting Fundamentals | FAF | 600/- | 600/- |
| FL 2 Financial Accounting Fundamentals | MAF | 600/- | 600/- |
| FL 3 Business Mathematics & Statistics | BMS | 600/- | 600/- |
| FL 4 Mgt., Corporate Governance & Ethics | BMS | 600/- | 600/- |
| FL 5 Bus. Econ. & Bus. Finance Fundamentals<br>SK 1 Business English 1 | BEF<br>BE 1 | 600/-<br>600/- | 600/-<br>600/- |
| | *Total* | **3600/-** | **3600/-** |

**Level 2 Operational Level**

| | | | |
|---|---|---|---|
| OL 1 Operational Management Accounting | OMA | 750/- | 750/- |
| OL 2 Financial Accounting & Reporting | FAR | 600/- | 600/- |
| OL 3 Operations and Info. Systems Mgt. | OIM | 600/- | 600/- |
| OL 4 Business Law & Taxation | BLT | 600/- | 600/- |
| SK 2 Business English 11 | BE 11 | 650/- | 650/- |
| SK 3 Information Technology Applications | ITA | 675/- | 675/- |
| | *Total* | **3875/-** | **3875/-** |

**Level 3 Managerial Level**

| | | |
|---|---|---|
| ML 1 Integrative Management Accounting | IMA | 750/- |
| ML 2 Corporate Reporting & Analysis | CRA | 750/- |
| ML 3 Marketing & People Management | MPM | 950/- |
| ML 4 Corporate Law & Advanced Taxation | CLT | 675/- |
| SK 4 Professional Communication | PC | **675/-** |
| | *Total* | **3800/-** |

**Level 4 Strategic Level**

| | | |
|---|---|---|
| SL 1 Strategic Management Accounting | SMA | 800/- |
| SL 2 Business Strategy & Policy | SMA | 750/- |
| SL 3 Financial Strategy & Policy | FSP | 650/- |
| SL 4 Risk & Control Strategy & Policy | RSP | 950/- |
| | *Total* | **3150/-** |

- පසුගිය ප්‍රශ්න පත්‍ර (සිංහල)
  2008 මාර්තු විභාගය හා ආදර්ශ ප්‍රශ්න පත්‍ර (උත්තර සමඟ) රු. 175/-
- පදනම් විභාගයට සූදානම් වන සිංහල / දෙමල මාධ්‍ය ශිෂ්‍යයන් ව්‍යාපාර ඉංග්‍රීසි 1 පෙළපොත මිලදී ගැනීම අනිවාර්යය.
- පදනම් විභාගයේ සියලුම අධ්‍යයන පෙළපොත් CMA කාර්යාලයෙන් මිලදී ලන්නා විට 10% ක වට්ටමක් දෙනු ලැබේ.
- විෂය නිර්දේශය මුද්‍රිත - රු 150, සීඩී තැටිය රු 50/,
- ඉහත මිල ගනන් වෙනස්වීමට ඉඩ ඇත.

## 18. ලේකම් කාර්‍යාලය

**සියළුම ලිපි ලේඛණ පහත ලිපිනයට යොමු කරන්න.**


විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
01, බෙතස්ඩා පෙදෙස,
ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවතෙන් හැරී,
කොළඹ 05.

දු.ක.: 2506391, 2501062, 4641701, 4641702, 4641703,
ජංගම: 0714705525, 0714705537
ෆැක්ස්: 2507087
ඊ මේල් : info@cma-srilanka.org, secretariat@cma-srilanka.org
වෙබ් අඩවිය. : www.cma-srilanka.org